# ග්‍රාමාරණ්‍යක භික්ෂු විභේදනය හා ශාසනික පැවැත්ම

වටරක්ගොඩ සුමන හිමි[1]

## හැඳින්වීම:

වනයෙහි වසන භික්ෂූන් ආරණ්‍යවාසී වන බවත් ගමෙහි වසන භික්ෂූන් ග්‍රාමවාසී වන බවත් සාමාන්‍ය මතයයි. එහෙත් මෙම භික්ෂු කණ්ඩායම් දෙකේ ප්‍රභවය, කණ්ඩායම් ලෙස ස්ථරගතවීම සහ එයට බලපෑ න්‍යායාත්මක කාරණා මොනවාද යන්න අධ්‍යයනය කිරීමෙන් උක්ත සාමාන්‍ය මතයට වඩා විශාල වපසරියක පැතිරෙන තොරතුරු අනාවරණය වේ. ශ්‍රී ලාංකේය භික්ෂු සංස්ථාව තුළ නිකායාන්තරික භේදය ඉක්මවා යමින් ජනිත සම්ප්‍රදායන් දෙකක් ලෙස ග්‍රාමවාසී සහ අරණ්‍යවාසී භික්ෂු සම්ප්‍රදායන් හඳුනාගත හැකිය. මෙම සම්ප්‍රදායන් දෙක මුල් කාලීනව පර්යාප්තිය හා ප්‍රතිපත්තිය යන සංකල්ප මත ද ඉන් අනතුරුව ග්‍රන්ථ ධූර හා විදර්ශනා ධූර යන සංකල්ප මත ද ක්‍රමිකව සංවර්ධනයට පත් වේ.

## පර්යේෂණ ක්‍රමවේදය:

මෙම බෙදීම පිළිබඳ අධ්‍යයනයේදී මහාවංශය සහ නිකාය සංග්‍රහය ප්‍රධානතම ප්‍රාථමික මූලාශ්‍ර ලෙසින් ද මේ සම්බන්ධයෙන් විද්වතුන් විසින් රචිත කෘති ද්විතීක මූලාශ්‍ර ලෙසන් ද භාවිත කරමින් ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදයේ ආකාරයට තොරතුරු අධ්‍යයනය කිරීමට අපේක්ෂා කෙරේ.

## ආරණ්‍යවාසී සහ ග්‍රාමවාසී සම්ප්‍රදායන්හි මුල්කාලීන ලක්ෂණ

ආරණ්‍යවාසී සහ ග්‍රාමවාසී සංස්ථාවන්හි ප්‍රභවයේ මූලික සේයා දිස් වන ක්‍රි.ව. පස්වන සියවසේදී පමණ රචනය ආරම්භ කරන අට්ඨකථා තුළින් ග්‍රාමවාස, අරණ්‍යවාස විභේදනයේ මුල්කාලීන වෙනස්කම් හඳුනා ගත හැකිය. තත්කාල වකවානුවේ ග්‍රන්ථ ධූරය බුද්ධිමත් ශරීර ශක්තියෙන් හෙබි භික්ෂූන් උදෙසා වෙන්වූවක් යැයි ද විදර්ශනාධූරය ශරීර ශක්තියෙන් හීන සමාජමය කාර්යයන් සඳහා කාලයක් නැති අය සඳහා ද වෙන්වූ බව පෙනේ. එසේම ක්‍රි.ව. පළමුවන සියවසේදී පර්යාප්තිය හා ප්‍රතිපත්තිය පිළිබඳව ඇති වූ විවාදයකින් පර්යාප්ති මත දරන පිරිස ජයග්‍රහණය කරන ලද බව අංගුත්තර නිකායට්ඨකථාව දැක්වීම තුළ ද පෙනී යන්නේ මුල්කාලීන යුගය තුළ ග්‍රන්ථ ධූරිකයන් නැතහොත් පර්යාප්තිකයන් ප්‍රබලව සිටි බවයි.

1 watarakgodasumana@gmail.com

**සම්ප්‍රදායන්හි සංවර්ධනය හා ගතිකත්වයන්**

මෙලෙස ඒකීය සංස්ථාවක් තුළ මතවාදීමය වශයෙන් ආරම්භ වූ වනවාස හා ග්‍රාමවාස සම්ප්‍රදායන්හි එතරම් දුරස්ථභවක් දැකීමට පාලකයන් අකමැති වූ බව පෙනේ. මෙකී සම්ප්‍රදායන් දෙකේ සාමාන්‍යකරණයකට දරන ලද උත්සාහයක් පිළිබඳව තොරතුරු පොළොන්නරු යුගයේ මහා පරාක්‍රමබාහු රජු විසින් කරන ලද කතිකාවතින් හෙළි වේ. එසේම පොළොන්නරු යුගය වන විටදී ග්‍රන්ථ ධූරිකයන්ට වඩා විදර්ශනා ධූරිකයන් සිල්වත්කමින් උසස් තත්ත්වයක සිටි බව මහා පරාක්‍රමබාහු රජු විසින් ශාසනික ශෝධනයේ නායකත්වය සඳහා දිඹුලාගල අරණ්‍යවාසී කාශ්‍යප හිමියන් පත් කර ගැනුමෙන් තහවුරු වේ. එසේම බාලාවබෝධන නම් ග්‍රන්ථයක් මෙම හිමියන් විසින් ම රචනා කිරීමෙන් පෙනී යන්නේ ආරණ්‍යවාසීන් ග්‍රන්ථ ධූරයෙහි ද නියැලෙමින් සිටි බවයි. පොළොන්නරු කතිකාවතින් පරාක්‍රමබාහු රජු නියම කරන ලද්ද භික්ෂු නායකත්වය විසින් අනුගමනය කිරීම තුළ තදීය සමයේ ග්‍රාමවාස හා අරණ්‍යවාස බෙදීම අවම කිරීමට ඉවහල් වූ බව පෙනෙයි.

ග්‍රාමවාසී සහ ආරණ්‍යවාසී යන උභයවාසය පිළිබඳ ඍජුව ම තොරතුරු දක්වෙන දඹදෙණි කතිකාවතෙන් තහවුරු වන්නේ ද භික්ෂූන් වහන්සේලා ග්‍රන්ථ ධූර, විදර්ශනා ධූර යන ධූර දෙකෙහිම දක්ෂයන් විය යුතු බවකි. තත්කාලීන භික්ෂු නායකත්වයන් දෙස බැලීමේදී එකී කාරණාවේ සත්‍යතාව වටහා ගත හැකිය. එසේම අරණ්‍යවාසී භික්ෂු සම්ප්‍රදාය නියෝජනය කළ භික්ෂූන් වහන්සේලා ලෞකික විෂයක්ෂේත්‍රයට අදාළ විෂයන් ගවේෂණය කළ බවට තොරතුරු හමු නොවේ. එබැවින් අරණ්‍යක හා ග්‍රාමීය භික්ෂු සම්ප්‍රදායන් අතර පැවති ප්‍රධාන විෂමතාවක් ලෙස ග්‍රාමීය පාර්ශ්වය විසින් ලෞකික විෂයන්ට නැඹුරුතාවයක් දැක්වීමත් ආරණ්‍යකයන් ත්‍රිපිටකය ප්‍රමුඛ කොට ගත් විෂයන් අධ්‍යයනය කිරීමත් පෙන්වාදිය හැකිය.

මෙකී විෂමතාවයේ ප්‍රබලත්වයේ වර්ධනයක් කෝට්ටේ යුගය තුළ දී දැක ගත හැකි වෙයි. ග්‍රාමවාසී භික්ෂු සම්ප්‍රදාය නියෝජනය කළ තොටගමුවේ රාහුල හිමියන් අධිපතිත්වය දැරූ තොටගමුවේ විජයබා පිරිවෙන තුළ ඡන්දස්, අලංකාර, ව්‍යාකරණ, සංස්කෘත, පාලි, දෙමළ, කාව්‍ය, නාට්‍ය ආදිය උගන්වන ලද බැව් ගිරා සංදේශයේ සඳහන් වේ. එසේ ම තොටගමුවේ රාහුල හිමියන් දහ අටක් වූ පුරාණයන්හි දක්ෂයෙකු බව ද එහි ම සඳහන් වේ. එහෙත් වනවාසී සම්ප්‍රදාය නියෝජනය කරන ලද කැරගල පද්මාවතී පිරිවෙන තුළ මෙකී ලෞකික විෂයන් හැදෑරීමට ඉඩහසර ලබා දී තිබූ බවත් නොපෙනෙයි. එහි අධ්‍යයනය ලබා දෙන ලද්දේ ත්‍රිපිටකයට අනුබද්ධිත විෂය ක්ෂේත්‍රයන් පමණි. එසේම කැරගල පද්මාවතී පිරිවෙනේ අධිපති තනතුර හෙබ වූ වනරතන හිමියන් සිව්සැට කලා අර්ථශූන්‍ය බව දක්වමින් ප්‍රතික්ෂේප කළ බව සඳහන් වීමෙන්ද පෙනී යන්නේ එකී සත්‍යතාවමය. මෙකී කරුණු තුළ පැහැදිලිවම ප්‍රකාශනයට පත්වන්නේ

අරණ්‍යවාසී භික්ෂු සම්ප්‍රදාය ප්‍රතිපත්ති කරුණු මත පිහිටමින් බුද්ධ ධර්මය ගවේෂණය කරන ලද බවත් ග්‍රාමවාසී භික්ෂූන් වහන්සේලා පර්යාප්තිය මත සිටමින් බුද්ධ ධර්මයට අමතරව තත්කාලීන ලෞකික වෛෂයික කාරණාවන් වෙත නැඹුරු වී කටයුතු කරන ලද බවත්ය. කෙසේ වෙතත් සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රයේ නව ප්‍රබෝධයක් ඇති වූ කෝට්ටේ යුගය තුළ එබඳු තත්ත්වයක් නිර්මාණය කිරීමේ හේතුකාරකයන් ලෙස උභයවාස විභේදනය හඳුනා ගත හැකිය. දෙපාර්ශ්වයම තරගයකට මෙන් එකිනෙකා පරයා ශාස්ත්‍රීය කටයුතුවල නිරත වන්නට විය. මෙම තත්ත්වයේ නියමාකාර ප්‍රකාශනයක් මෙම යුගයේ පඤ්ච මහා පිරිවෙන් විසින් චිත්‍රණය කරනු ලැබ තිබේ.

දඹදෙණි යුගයේදී ග්‍රාමාරණ්‍යක වශයෙන් බෙදී ගිය සම්ප්‍රදායන්හි දැඩි වෙනසක් දැකගත නොහැකි වූ අතර පොදු ශාසනික ක්‍රියාවන් සඳහා දෙපාර්ශ්වයම සම දායකත්වයක් ලබා දුණි. එහෙත් ගම්පොළ යුගයේ රාජ්‍ය අස්ථාවරත්වය හමුවේ ග්‍රාමීය භික්ෂු සංස්ථාවේ ක්‍රියාකාරිත්වය කෙබඳු ද යන්න හඳුනා ගත නොහැකි තරමට එම සම්ප්‍රදාය පරිහානියට ලක් වෙමින් තිබුණු අතර ආරණ්‍යක සංස්ථාව සසුනේ නිසි බලධරයා වෙමින් ක්‍රියාකාරීව ශාසනික කටයුතු සිදු කරනු ලබයි. දඹදෙණි, කුරුණෑගල, ගම්පොළ යුගයන්හිදී උභයවාසී භික්ෂූන් පොදු නායකත්වයක් වටා කේන්ද්‍රගත වන අතර එම පොදු නායකත්වය මහාසාමි නමින් හඳුන්වනු ලැබීය. මෙම පොදු නායකත්වය ග්‍රාමාරණ්‍යක උභයවාසී භික්ෂූන් අතර මාරුවෙන් මාරුවට පැමිණෙන ආකාරය දක්නට ලැබෙන අතර පෙර සඳහන් කළ ලෙසට ම රාජ්‍ය අස්ථාවර වූ අවස්ථාවන්හිදී ආරණ්‍යක නායකත්වය මතුව පෙනෙයි. මෙකී තත්ත්වය මහනුවර යුගයේදී ද දක්නට ලැබෙන නිසා ඒ සඳහා පොදු න්‍යායාත්මක කරුණක් බලපාන ලද බව වටහා ගත හැකිය. ලෞකික සමාජ සංස්ථාව හා බද්ධිතව නිරතුරුව සමාජ කර්තව්‍යයන් වෙත දායක වෙමින් උවසු උවැසියන් අතර කල් ගෙවූ ග්‍රාමවාසීන් සෑම විටම රටේ සමාජ තත්ත්වය ව්‍යාකූල වූ විට ඉක්මනින් පරිහානියට පත් වූ අතර අරණ්‍යයේ වසන වනවාසී භික්ෂූන්ට එම බලපෑම ලැබුණේ අවම වශයෙනි. එනිසා එබඳු සමයන්හි අක්‍රිය ග්‍රාමවාසය පරයා සක්‍රීය ආරණ්‍යවාසී ගතිකත්වය පෙරටු කර ගනිමින් සංඝ සංස්ථාව ඉදිරියට ගමන් කොට තිබේ.

**නිගමනය**

සීතාවක යුගයේ පළමු රාජසිංහ රජු විසින් කරන ලද ශාසනික විලෝපනය හේතුවෙන් අවනතිය කරා ගමන් කළ ශාසනය යළි ප්‍රගතිගාමී මාවතකට යොමු කරන ලද්දේ ආරණ්‍යක සම්ප්‍රදායේ මූලිකත්වයෙන් ගොඩනැගෙන අස්ගිරි විහාරය විසිනි. තදීය සමයේ ලංකාව පුරා ප්‍රචලිත ආරාමයන්හි මූලිකත්වය දරන ලද්දේද මෙම විහාරයයි. පශ්චාත් කාලීන සංඝ සංස්ථාවේ ප්‍රබෝධයට සහ වර්ධනයට මෙකී ආරණ්‍යවාසයේ දායකත්වය ප්‍රබල

ලෙස ලැබී තිබේ. මෙම සමය තුළ ස්ථිර වශයෙන් ම ආරණ්‍යවාසී භික්ෂු පරපුරක උරුමය හඳුනාගත හැකි වුවද ග්‍රාමවාසීන්ගේ නිශ්චිත ඓතිහාසික උරුමයක සේයා හඳුනා ගැනීමට සාධක නොමැති බව මෙම අධ්‍යයන තුළ දී තහවුරු වූ තවත් සුවිශේෂී කාරණයක් ලෙස පෙන්වා දිය හැකිය. දහතුන් වන සියවසේ දී ස්ථිර වශයෙන්ම ඇරඹෙන මෙකී සම්ප්‍රදායන් ද්විත්වය, එතැන් පටන් ශාසනයේ සියලු ගතිකත්වයන් තීරණය කෙරෙමින් වර්තමානය දක්වා පවතින බව පැහැදිලිය.

**ප්‍රමුඛ පද:** ග්‍රාමවාසී, අරණ්‍යවාසී, භික්ෂු, සම්ප්‍රදය,

**ආශ්‍රිත ග්‍රන්ථ**

*උගන පූරණසහිත මහාවංසො.* (1959). (සංස්.) පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

*නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය.* (1988). (සංස්.) ගුණවර්ධන නානායක්කාර. කොළඹ: ඇම්.ඩී. ගුණසේන හා සමාගම.

*අස්ගිරි තල්පත,* (1969). (සංස්.) මැන්දිස් රෝහණදීර, ගංගොඩවිල: විද්‍යෝදය විශ්වවිද්‍යාලය මුද්‍රණාලය.

ජයතිලක, ඩී.බී. (1984). *කතිකාවත් සගරා.* කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

රාහුල හිමි, වල්පොල, (2009). *ලක්දිව බුදුසමයේ ඉතිහාසය.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.